# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 56 දරන

# නුගවෙල, මාලගම්මන රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරනු ලදී.

---

1992 නොවැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරනු ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිල : ශත 90 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 56 දරන නුගවෙල, මාලගම්මන රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 36/91

**නුගවෙල මාලගම්මන රජමහා විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"නුගවෙල මාලගම්මන රජමහා විහාරස්ථ සංවර්ධන සභාව" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එහි සාමාජිකයින් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් නුගවෙල මාලගම්මන පිහිටුවාගෙන තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කොට සහ ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් ද එම සංගමය සංස්ථාගත කරනු ලැබීම පිණිස ඉල්ලීමක් කර ඇති හෙයින් ද සහ එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1992 අංක 56 දරන නුගවෙල මාලගම්මන රජ මහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරන) නුගවෙල මාලගම්මන රජමහා විහාරස්ථ සංවර්ධන සභාවේ සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කෙරෙන) "නුගවෙල මාලගම්මන රජමහා විහාරස්ථ සංවර්ධන සභාව" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධවද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමටද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමටද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. නුගවෙල මාලගම්මන රජමහා විහාරස්ථ සංවර්ධන සභාව සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) නුගවෙල මාලගම්මන රජමහා විහාරය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම හා එම ගොඩනැගිලි නඩත්තු කිරීම ;

(ආ) බෞද්ධ ආගමිකයන්ගේ ආගමික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) නුගවෙල මාලගම්මන රජමහා විහාරයේ වැඩ වසන භික්ෂූන් වහන්සේලා සඳහා අධ්‍යාපන පහසුකම් සැපයීම සහ උන්වහන්සේලාගේ එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමට උපකාර කිරීම ;

(ඈ) රජමහා විහාරය පිහිටි ප්‍රදේශයේ සහ ඒ අවට ගම්වල හා ප්‍රදේශවල පැරණි කලා ඇතුළුව සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ සංස්කෘතික අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව පැරණි ගොඩනැගිලි චිත්‍ර සහ පුරාවස්තු සංරක්ෂණය කිරීම ;

(ඊ) සතර දේවාලයේ අනුග්‍රහය ඇතිව රජමහා විහාරයේ වාර්ෂික පෙරහැර සංවිධානය කිරීම ;

(උ) පෙර පාසලක් සහ පුස්තකාලයක් පිහිටුවීම, ඒවාට අවශ්‍ය සැපයීම් සහ ඒවා නඩත්තු කොට පවත්වාගෙන යාම ;

(ඌ) පෙරදිග භාෂා සඳහා අංශයක් පිහිටුවා පවත්වාගෙන යාම ;

(එ) ඉංග්‍රීසි, ප්‍රංශ වැනි ජාත්‍යන්තර භාෂා සඳහා අංශයක් පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඒ) ජාත්‍යන්තර වශයෙන් ධර්ම ප්‍රචාරය කිරීමේ කටයුතුවල යෙදීම ;

(ඔ) බෞද්ධ දර්ශනය සහ ජීවන මාර්ගය ආරක්ෂා කිරීම හා ප්‍රචාරය කිරීම ;

(ඕ) ශ්‍රී ලංකාවේ හා පිටරට වෙනත් බෞද්ධ සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා ඇතිකර ගැනීම ;

(ක) ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට වෘත්තීය අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම ;

(ග) ශිෂ්‍යයන්ට කුඩා කර්මාන්තවල පුහුණුව ලබාදීම සහ ප්‍රයෝජනවත් පුරවැසියන් වශයෙන් ස්ථාපනය වීම පිණිස ඔවුන්ට මුදලින් හෝ අන්‍යාකාරයෙන් උපකාර වීම ;

(ච) පිරිවෙන්, පාසල් සහ අධ්‍යාපන ආයතන පිහිටුවා නඩත්තු කිරීමෙන් සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමෙන් අධ්‍යාපනය නංවාලීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ජ) දුප්පත්, අනාථ සහ රෝගී තැනැත්තන්ට වෛද්‍ය සහන, ආහාර, ඇඳුම් පැළඳුම් සහ නිවාස සැපයීම ;

(ට) අනාථ නිවාස සහ මහළු නිවාස අසරණ අය සඳහා පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ සමාජ ශුභ සාධන මධ්‍යස්ථාන පිහිටුවීම ;

(ඩ) අඳ, ගොළු, බිහිරි සහ ආබාධිත තැනැත්තන් සඳහා ශුභ සාධන පහසුකම් සැලසීම සහ නිවර්තන නිවාස පිහිටුවීම ;

(ත) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීමෙහිලා නිරතවන ස්වේච්ඡා සේවකයින්ට සහ වෙනත් තැනැත්තන්ට ශිෂ්‍යත්ව මගින් හෝ මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර දීම;

(ද) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම, පොත්පත්, සඟරා, සමරු කලාප සහ වාර සඟරා ආදියට දායකවීම සහ ඒවා නිකුත් කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යෝග්‍ය වෙතැයි සලකනු ලබන වෙනත් සේවා සැලසීම;

(න) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමෙහිලා ප්‍රදර්ශන, දේශනා, සම්මන්ත්‍රණ, දාර්ශනික සාකච්ඡා, වැඩමුළු, පන්ති, විවාද, සම්මේලන, චාරිකා, විනෝදගමන් හෝ වෙනත් කටයුතු ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම, සංවිධාන කිරීම හා පැවැත්වීම;

(ප) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් සමිති, සංගම් හෝ සංවිධාන සමග සහයෝගී වීම සහ සාහචර්ය වීම;

(බ) ජනතාවට තාක්ෂණික විශේෂඥතාවය ලබාදීම අරමුණුකොට ගෙන, යම් කර්මාන්තයක, වෘත්තියක හෝ අපනයන හෝ ආනයන ව්‍යාපාරයක නිරතවීම සහ යම් කෘෂිකාර්මික සහ ව්‍යාපාරික ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීම සහ කර ගෙන යාම, එවැනි ව්‍යවසායන් සඳහා යම් තැනැත්තකුට ආධාර සහ උපකාර කිරීම, පුහුණු කිරීමේ වැඩ පිළිවෙලවල් පවත්වා ගෙන යාම සහ සේවා සහ ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම;

(ම) ආයුර්වේද සහ දේශීය වෛද්‍ය විද්‍යා අධ්‍යයනය කිරීමේ වැඩ පිළිවෙලවල් සහ ඒ සඳහා අධ්‍යයන උසස් අධ්‍යාපන ඩිප්ලෝමා සහ වෙනත් අධ්‍යයන පාඨමාලා පැවැත්වීම;

(ය) අධ්‍යාපනික කටයුතු කරගෙන යන යම් දේශීය හෝ විදේශීය තාක්ෂණික හෝ වෘත්තීය අභ්‍යාස ආයතනයක, අනුබද්ධ ආයතනයක් ලෙස හෝ නියෝජිතයන් ලෙස ක්‍රියා කිරීම;

(ර) ඉහත සඳහන් පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය හිතකර හෝ වෙනත් ආනුෂංගික වන හෝ විය හැකි වෙනත් ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබාගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීම හා එකතු කිරීම, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටු කරගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ යෙදවීම සහ සේවයෙන් පහකිරීම ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ඉෂ්ට කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කාරණා සහ දේවල්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සිදු කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු අධ්‍යක්ෂ ජනරාල්, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව තෝරා පත්කරගනු ලබන හය දෙනෙකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකරණ කමිටුවක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණද, ගෞරවාචාර්ය පණ්ඩිත බෝවත්තේ රතනජෝති ස්වාමින්ද්‍රයන් වහන්සේ සංස්ථාවේ යාවජීව අධ්‍යක්ෂ ජනරාල් විය යුතු අතර, උන්වහන්සේගෙන් පසු අධ්‍යක්ෂ ජනරාල් ධුරයට උන්වහන්සේගේ අනුප්‍රාප්තිකයා උන්වහන්සේ විසින් නම් කරනු ලැබිය යුතු ය. එසේ අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂ ජනරාල්වරයාද යාවජීව අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් වන්නේ ය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී නුගවෙල මාලගම්මන රජමහා විහාරස්ථ සංවර්ධන සභාවේ කළමනාකාර කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූද මෙහි උපලේඛනයේ නම් සඳහන් කොට ඇත්තා වූ ද තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) පහත දැක්වෙන සියළුම කරුණු හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයින්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) සංස්ථාවේ නිලධරයන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය හිස් කිරීම හෝ ඔවුන් ධුරයෙන් නෙරපීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ආ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ කළමනාකරණ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ කළමනාකරණ මණ්ඩලයේ සාමාජික යන්ගේ ධුර කාලය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, පැවැත්වීම සහ ඒ රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන දිනය, ස්ථානය, රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර හා රැස්වීම්වල ගණපූරණය සහ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම ;

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උප වගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන්ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියළුම සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෑග්, පූජා, පරිත්‍යාග, සම්මාදම් මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් කළමනාකාර කමිටුව විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා යම් අගය ක්ෂය වීමේ අරමුදලක් හෝ තිදත් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**සභාව විසින් ගෙවිය යුතු සහ සභාවට අයවිය යුතු ණය.**

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී පැවති සභාව විසින් ගෙවිය යුතුව තිබුණු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සභාවට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ ලැබිය යුතුව තිබුණු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත්කාලයේ වලංගුව බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් දැරිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.**

10. අධ්‍යක්ෂ ජනරාල් සහ ලේකම් හෝ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම් අත්සන් කළ යුතුය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කළ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම ආරක්ෂා කිරීම.**

11. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හා ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම් වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය හෝ සංස්ථාගත මණ්ඩලයක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

[5 (8) වගන්තිය]

## උපලේඛනය

### කළමනාකාර කමිටුව

අධ්‍යක්ෂ ජනරාල් : ගෞරවාචාර්ය පණ්ඩිත බෝවත්තේ රතනජෝති ස්වාමින්ද්‍රයන් වහන්සේ

ලේකම් : උල්ලදුපිටියේ විනීතධම්ම හිමිපාණෝ

උප ලේකම් : ජේ. එම්. ජයතිලක බණ්ඩාර මහතා

භාණ්ඩාගාරික : දයා ප්‍රේමලාල් බෝවත්තේ මහතා

සභිකයින් : ඩී. බී. පලිපාන මහතා

ජේ. බී. ඒකනායක මහතා
ආර්. බී. වැරැල්ලගම මහතා
එස්. එම්. ධර්මරත්න මහතා
කේ. බී. වැරැල්ලගම මහතා
නිහාල් ඇල්කඩුව මහතා
සී. බී. ඉද්දවල මහතා
එස්. බී. වැරැල්ලගම මහතා
මහින්ද විජේසුන්දර මහතා
ඒ. ඩබ්. බී. විජයවර්ධන මහතා
ඩබ්. ඉන්ද්‍රපාල ද සිල්වා මහතා
සී. බී. ජේ. වැරැල්ලගම මහතා
බී. එම්. කරුණාරත්න බණ්ඩා මහතා
චන්දුල විපුල කුමාර මහතා
සී. බී. කහවත්ත මහතා
ජේ. ඩබ්. ආරියදාස මහතා
එම්. බී. අමුණුගම මහතා
ජිනදාස මාලගම්මන මහතා
ආර්. එම්. නාලිනී කුමාරිහාමි රත්නායක මහත්මිය
ඩී. ජී. ජී. මාලගම්මන මහත්මිය
සන්ද්‍රා වීරසූරිය මහත්මිය
විජය මැණිකේ මල්ලිකාරච්චි මහත්මිය
රානි කහවත්ත මහත්මිය
සන්ද්‍රා වැරැල්ලගම මහත්මිය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.